# ජාකෝපෝ ද පොන්ටෝමෝ සහ යුරෝපයේ මැනේරියානුවාදී කලාවෙහි ප්‍රවණතා

රත්නවීර පටබැඳිගේ සුපුනි හසින්ති[1]

මැනේරියානු කලාව ආරම්භ වන්නේ ඉතාලියේ අධිපුනරුද යුගයෙන් පසු ව ය. අධිපුනරුද සම්ප්‍රදායයෙන් ලබාගත් ලක්ෂණ ශෛලීගත ආකාරයකින් උපයෝගී කරගන්නා ලද්දේ මැනේරියානුවාදීන් විසිනි. මෙකී මැනේරියානුවාදී කලාවේ Pontomo පුරෝගාමී ප්‍රබල ශිල්පියකු ලෙස හඳුන්වාදිය හැකි ය. ඔහු විසින් මැනේරියානුවාදී කලාවේ සෛද්ධාන්තික පක්ෂය මතු කර දැක්වීමට ගන්නා ලද උත්සහය කැපීපෙනේ. උච්ච පුනරුද යුගයේ වූ විද්‍යාත්මක යථාර්ථවාදී කලාවෙන් ඈත් වූ පොන්ටෝමෝ වඩාත් ජනප්‍රිය වූයේ මැනේරියානු කලාවේ ලක්ෂණ ප්‍රකට කරමින් සිය කලා කටයුතුවල නිමග්න වීම හේතුවෙන් වීම විශේෂත්වයකි. ඩාවින්සි සහ මිකලාන්ජලෝගේ කලා නිර්මාණ කෙරෙහි ඔහු දැඩි රුචිකත්වයක් දැක් වුව ද පොන්ටෝමෝ ගේ නිර්මාණවල වැඩි වශයෙන් දක්නට ලැබුණේ කායික ශක්‍යතාවට වඩා මානසික ශක්‍යතාව යි. එනම් ඔහුගේ මූලික පරමාර්ථය වූයේ මිනිසුන්ගේ මානසික ස්වභාවය, චිත්තවේගාත්මක ස්වභාවය සිය නිර්මාණවලින් නිරූපණය වන ලෙස නිර්මාණකරණයේ නිමග්න වීම බව ඔහුගේ නිර්මාණ විශ්ලේෂණයේ දී පෙනීයයි. උදාහරණ ලෙස ඔහුගේ ‘Halberdier' නිර්මාණය හැඳින්විය හැකි ය. බෙහෙවින් ජවසම්පන්න අංග චලන අලංකාර රේඛා හැඩතල, එක ම පසුතලයක දක්වමින් අවකාශය භාවිතය, විසංගත වර්ණ භාවිතය ආදි ලක්ෂණ ඔහු මැනේරියානු කලා ශිල්පියකු වූ බව ප්‍රකට කරවයි. විචක්ෂණ ශෛලිගත ක්‍රමයකින් මැනේරියානු චිත්‍ර ශිල්පියකු හා ආලේඛ්‍ය චිත්‍ර ශිල්පියකු ලෙස ඔහු කටයුතු කිරීමට සමත් විය. ක්‍රි. ව. 1518 දී ශාන්ත මිචෙල් විස්ඩොම් (Michel Visdomi) දේවස්ථානයේ අල්තාරයේ ඔහු විසින් කරන ලද නිර්මාණ මීට නිදසුන් ලෙස දැක්විය හැකි ය. භෞතික තත්ත්වය අබිබවා ගිය ආධ්‍යාත්මික තත්ත්වය නිරූපණය, අලංකාරවත් රේඛීය රිද්මය, චංචල චලන නිරූපණය, නොපැහැදිලි අවකාශය, දීප්තිමත් වර්ණ භාවිතය මෙකල ඔහුගේ සිතුවම්වල කැපීපෙනෙන ලක්ෂණ ලෙස හඳුනාගත හැකි ය. මෙකී ලක්ෂණ මැනේරියානුවාදී කලාවේ පුරෝගාමීන් උපයෝගි කරගත් බව පොන්ටෝමෝගෙන් පසු ව නිර්මාණකරණයෙහි නියැලි Andrea Del Sarto, Bronzino වැනි ශිල්පීන්ගේ නිර්මාණවලින් ප්‍රකට වේ. මේ අනුව මූලික ව ම ආගමික චිත්‍ර ශිලපියකු ලෙස කලා මඟට අවතීර්ණ වූවත් පසුකාලීන ව ආගමික තේමාවලින් ඔබ්බට මිථ්‍යා තේමා ද ආලේඛ්‍ය සිතුවම්කරණය කෙරේ ද යොමු වූ පොන්ටෝමෝ මැනේරියානු කලාවේ ක්‍රියාකාරී ශිල්පියකු වූ බව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පදඃ** මැනේරියානු කලාව, සිතුවම් ශෛලිය, ආලේඛ්‍ය සිතුවම්කරණය, පොන්ටෝමෝ, මානසික ශක්‍යතාව

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසගිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය